# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## අධිකරණ සංවිධාන (සංශෝධන)

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය විසින්
2019 මාර්තු මස 06 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2019 පෙබරවාරි මස 15 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[273 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ සමාදාන විනිශ්චයකාරවරයකුට යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා පත්වීමට හැකියාව ලබා දීම සහ මෙම අතුරු විධානය බලාත්මක වන දිනයට පෙර යම් කලාපයක්, දිස්ත්‍රික්කයක් හෝ කොට්ඨාසයක් සඳහා පත් කරනු ලැබූ යම් සමාදාන විනිශ්චයකාරවරයකු එසේ පත් කරනු ලැබූ වේලාවේ දී එම සමාදාන විනිශ්චයකාරවරයාගේ වාසස්ථානය පිහිටා තිබූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත් එම පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබීමට සහ අමාත්‍යවරයාට නියෝග මඟින් සමාදාන විනිශ්චයකාරවරයකුගේ තනතුර අත්හිටුවීමට, අවලංගු කිරීමට සහ අවසන් කිරීමට හැකියාව ලබා දීම ය.

# අධිකරණ සංවිධාන (සංශෝධන)

එල්. ඩී.—ඕ. 33/2017

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2019 අංක     දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

1978 අංක 2 දරන පනතේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2) අමාත්‍යවරයා විසින්, කලින් කලට ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් ඒ දැන්වීමෙහි නම් කරනු ලබන යම් තැනැත්තන් ශ්‍රී ලංකා ජනරජය සඳහා හෝ යෝග්‍ය යයි අමාත්‍යවරයාට පෙනී යන යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා සමාදාන විනිශ්චයකාරවරයන් වශයෙන් පත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, යම් කලාපයක්, දිස්ත්‍රික්කයක් හෝ කොට්ඨාසයක් සඳහා මේ අතුරු විධානය බලාත්මක වන දිනයට පෙර, සමාදාන විනිශ්චයකාරවරයකුගේ යම් පත් කිරීමක් සිදුකරනු ලැබ ඇති අවස්ථාවක දී, එම පත් කිරීම එම සමාදාන විනිශ්චයකාරවරයාගේ වාසස්ථානය පිහිටා තිබූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත් අදාළ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා සිදු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.".

(ii) (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(2අ) මේ වගන්තියේ කාර්යය සඳහා "පරිපාලන දිස්ත්‍රික්කය" යන්නෙන්, (392 වන අධිකාරය වූ) පරිපාලන දිස්ත්‍රික්ක පනත යටතේ පිහිටුවන ලද පරිපාලන දිස්ත්‍රික්කයක් අදහස් වේ.".

(iii) (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(6) අමාත්‍යවරයා විසින් සමාදාන විනිශ්චයකාරවරයකුගේ ධූරය අත්හිටුවීම, අවලංගු කිරීම සහ අවසන් කිරීම සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.".

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.